# අපේක්ෂකයන් තෝරාගැනීමේදී 'මාර්තු 12' ප්‍රතිපත්ති පිළිගන්න

## පෙත්සම අත්සන් කිරීම හෙට

**ඉන්දික හේවාවිතාරණ**

ඉදිරි මැතිවරණ සඳහා අපේක්ෂකයන් තෝරාගැනීමේදී පුරවැසි සංවිධාන හා පැෆරල් සංවිධානය විසින් හඳුන්වාදුන් ප්‍රතිපත්ති 08 ට අනුව අපේක්ෂකයන් තෝරාගන්නා ලෙස පක්ෂ නායකයන්ට බලකරන පෙත්සමට අත්සන් දසලක්ෂයක් ලබාගැනීම හෙට (25දා) උදෑසන 9.00 ට නිදහස් චතුරශ්‍රයේදී ආරම්භ කෙරෙන බව පැෆරල් සංවිධානය පවසයි.

මාර්තු 12 වැනිදා මෙම ප්‍රතිපත්ති හඳුන්වාදුන් බවත්, එය ක්‍රියාත්මක කරන බවට පක්ෂ නායකයන් පොරොන්දු ලබාදුන් බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මීට අමතරව ජනතා බලයක් ඇති කිරීම සඳහා අත්සන් දසලක්ෂයක් ලබාගැනීමට කටයුතු කරන බවත්, එය හෙට සිට ජූලි 05 වැනිදා දක්වා රට පුරා ප්‍රධාන නගරවලදී සිදු කරන බවත් ඔහු පවසා සිටියේය.

ඉන්පසුව මෙහි පිටපත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට, එක්සත් ජාතික පක්ෂයේ ජාතික නායක අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට සහ අනෙකුත් පක්ෂ නායකයන්ට ලබාදෙන බවද ඒ මහතා වැඩිදුරටත් පැවසුවේය.



අද 2015-06-24